විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව

"මං ඔයා නං ඒ පැත්ත
පලාතෙ යන්නෙ නැහැ"
ඔහු පසුව කීවේ ය.

ස්නේහා සිනාසුණා ය.

"හොඳ වෙලාවට මං ඔයා
නොවුණෙ" ඒ සිනාවෙන්ම
ඇ කීවා ය.




## ස්නේහාගේත් අකලංකගේත් කතාව



රාත්‍රිය නිසංසල ය. හමා යන මද සුළඟින් පොල් අතු සෙළවෙන හඬත් ඉඳහිට ඈතින් ඇසෙන සතෙකුගේ හඬත් ඇරෙන්නට වෙනත් ශබ්දයක් නෑසෙන තරම් ය.

හැන්දෑවට මහනුගේ කන්ද ඔබ්බෙන් ඉර බැසගෙන යන විට ස්නේහාගේ ගෙදර මිදුලට එහි සෙනැල්ල වැටෙන නිසා කල් ඇතිවම පරිසරය කලුවර වෙයි. මල්ලීත් නංගීත් පාඩම් පොත් අගට ගන්නා තෙක් ඔවුන් සමග සිටි ස්නේහා එළවලු දෙකක් සමග බත් ඉව්වා ය. තමා නැති දිනවල තාත්තා අතින් සැකසෙන කෑමට වඩා රසට උයන්නට තමාට නොහැකි යයි ස්නේහාට සිතුණි. තාත්තා ඇඟපත සෝදාගෙන ගෙට ගොඩවුණේ ස්නේහා බත ලිපෙන් බාන විට ය.

"වත්ත පල්ලෙහාටම සුවඳ ආවා... තාත්තා කීවේ කරේ තිබූ තුවාය නවාදමන අතර ය. "අපරාදෙනෙ ලොකු පුතා මහන්සිවුණේ.. මං මොනා හරි හදන්නයි හිටියෙ"

"තාත්තා හැමදාම උයන එකනෙ.. අද නිවාඩු ගන්න.. ඔන්න මං හාල්මැස්සො තෙල්දාලා පරිප්පු ඉව්වා.. රතුහාලෙ බතට"

"බත් මරන්න බැරියෑ ඒ දෙකත් එක්ක.." තාත්තා සිනසෙමින් කියයි "...මං හෙට දවල්ට ගොටුකොළ ටිකක් ගෙනැත් දෙන්නම්.. ගොටුකොළ මැල්ලුමකුත් හැදුව නම් කියල වැඩක් නෑ"

තමා හදිසියේ ගෙදර ආවේ ඇයිදැයි තාත්තා විපරම් කර නෑසීම ගැන ස්නේහා පුදුම වූයේ නැත. ඒ තාත්තාගේ හැටි ය. ඔහු කලබලවන්නේ නැති බව ස්නේහා දනියි. හෙට නැත්නම් අනිද්දා ඔහු හීන් සීරුවේ එය අසනු ඇති බව ඇය දනියි.

"හැමදාම කෑම උයද්දි මට ලොකු පුතා මතක් වෙනවා.. කොළඹට වෙලා මොනවා කනවා ඇද්ද කියලා දුක හිතෙනවා.. "

ස්නේහා සිනාසෙයි. කොළඹදී ඇය කෑම ගැන කිසිදු උනන්දුවක් නොදැක්වුවා ය. ඔහේ අතට අහුවුණ දෙයක් කෑවා විනා තෝරා බේරාගෙන කන්ට තරම් ඉස්පාසුවක් ඇයට නොවී ය.

"බෝඩිං වල කෑම ගැන ඉතින් මොන කතාද? අනිත් එක ලොකු පුතත් කන බොන සේවලට හපනිනෙ" තාත්තා නැවත කියයි.

ස්නේහා පිළිතුරක් නොදී කුස්සිය අස්පස් කළා ය.

"ලොකු පුතා ටික දවසක් ඉන්නව නේද?" තාත්තා තවත් ප්‍රශ්නයක් අසයි.

"ඔව් තාත්තෙ.. සමහරවිට මාසයක් හමාරක් ඉන්නවෙයි..." ස්නේහා කීවාය. ඒ මාසය හමාර අවුරුද්දක් දෙකක් වන්නටත් බැරි නැතැයි ඇයට ඒ අතර සිතුණි.

අවුරුදු ගණනාවක් වෙහෙස වි-ගොඩනගාගත් ලෝකය දින දෙකක් තුළ බි-වැටුණ ආකාරය සිතාගන්නටවත් නොහැකිය. සියල්ල හීනයක් වැනි ය. නන්නාඳුනනා තරුණයකු විසින් තමාගේ ජීවිතය බිමටම ඇද දමනු ලැබූ ආකාරය සිතාගන්නටවත් නොහැකි ය. උන්ගේ සල්ලි හමුවේ දුප්පත් තමාට හැප්පෙන්නට නොහැකි වීමේ වරද ඇත්තේ කොතැනදැයි ස්නේහා සිතුවාය. ඇයට නොදැනුවත්වම සුසුමක් පිටවිය. එය දකින්නට තාත්තා කුස්සයේ නොසිටීම භාග්‍යයක් විය.

ඒ රාත්‍රිය ස්නේහාට බොහෝ දිග රාත්‍රියක් විය. නංගීත් මල්ලීත් නින්දට ගිය පසු තාත්තා බොහෝ වේලාවක් සාලයේ පුටුවක වාඩිවී කල්පනා කරමින් සිටිනු ස්නේහා දුටුවා ය. ඇය නිදන්නට ඇඳට යන විටත් ඔහු සිටියේ කල්පනාවේ ය. තමා වචන වලින් නොකීවත් තාත්තාට බොහෝ දේ තේරෙන බව ස්නේහා දැන සිටියා ය. ඇඳට ගියද නින්ද ඇය කරා නාවේ සිත නොසන්සුන්ව තිබුණ නිසා ය. ඊයේත් අදත් සිදුවී සියල්ල මෙනෙහි නොකර සිටින්නට උත්සාහ කල ද ඒවා සිත මතුපිටට පැමිණෙමින් කරදර කරයි. මේ සියල්ලට මුල්

34 වන පිටුවට